# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1901/22 - 2015 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා - 2015.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)



# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2015 අංක ....... දරන වයඹ පළාත් සමාජ සේවා ප්‍රඥප්තිය

මෙහි පහත පළකරනු ලබන වයඹ පළාතේ පළාත් සභාවේ 2015 අංක ....... දරන වයඹ පළාත් සමාජ සේවා ප්‍රඥප්තිය මෙම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට දින 30ක් ඉකුත් වීමෙන් පසුව වයඹ පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත්, ඒවා එම දින 30ක කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

සන්ධ්‍යා එස්. කුමාර රාජපක්ෂ,
සමාජ සුහසාධන, පරිවාස හා ළමාරක්ෂක,
වනිතා කටයුතු, ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සහ
ග්‍රාම සංවර්ධන අමාත්‍ය.

2015ක් වූ පෙබරවාරි මස 11 වැනි දින,
කුරුණෑගල වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණයේ,
2 වන මහලේ පිහිටි,
සමාජ සුහසාධන, පරිවාස හා ළමාරක්ෂක,
වනිතා කටයුතු, ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සහ
ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**වයඹ පළාතේ පළාත් සභාවේ........... දරන වයඹ පළාත් සමාජ සේවා ප්‍රඥප්තිය (කෙටුම්පත)**

වයඹ පළාත තුළ පදිංචි අනාථ තැනැත්තන් සහ පවුල් පුනරුත්ථාපනය කිරීම, කායික මානසික සහ සාමාජික වශයෙන් ආබාධ සහිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ සුහසාධනය, අබල සහ සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන්ට සහන සැලසීම ඇතුළු සුහසාධන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහාත් එයට අනුශාංගික වූ කරුණු වෙනුවෙන් විධිවිධාන සැලැස්වීම සඳහාත් වූ ප්‍රඥප්තියකි.

දීර්ඝ නාමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ වයඹ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මේ ප්‍රඥප්තිය ...... දරන වයඹ පළාතේ වයඹ පළාත් සභාවේ සමාජ සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.

ප්‍රඥප්තියේ අරමුණු

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

(1) වයඹ පළාත තුළ පදිංචි සුභසාධන සේවා සැලසිය යුතු දිළිඳු හා අසරණ පුද්ගලයින්ට ආධාර සහන සේවා සැපයීම, ඔවුන්ගේ පුනරුත්ථාපනය හා සංවර්ධනය

(2) කායික, මානසික හා සමාජීය වශයෙන් ආබාධ සහිත පුද්ගලයින් සහ අසරණ වූ වයෝවෘද්ධ පුද්ගලයින් සඳහා රැකවරණය පුනරුත්ථාපනය හා සංවර්ධන සැලසීම.

(3) කායික, මානසික වශයෙන් ආබාධ සහිත පුද්ගලියින් සහ වැඩිහිටි තැනැත්තන් සඳහා ස්වේච්ඡා පදනමින් හෝ ව්‍යාපාරික අරමුණින් හෝ වෙනත් අරමුණකින් හෝ පවත්වාගෙන යනු ලබන නිවාස හා ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම හා ස්වේච්ඡා නිවාස හා ආයතන සඳහා ආධාර ලබදීම.

(4) දිළිඳු සහ අසරණ ජන කොටස් සඳහා සහන සැලසීම, ජීවිකාවෘත්තියක යෙදිය නොහැකි ක්ෂය රෝග, පිළිකා, ලාදුරු, තැලසීමියා රෝගාබාධ සහිත තැනැත්තන් හා වෙනත් හඳුනාගත් විශේෂ රෝග සඳහා ආධාර සැපයීම.

## I කොටස

### පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම, එහි සංයුතිය, බලතල හා කාර්යයන්

පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකිරීම සඳහා වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්පසු දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන ආයතනයක් පිහිටිවිය යුතු වන්නේ ය.)

අධ්‍යක්ෂවරයාගේ පත් කිරීම

4. (1) මෙහි මින්මතු අධ්‍යක්ෂ වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පංතියේ නිලධාරියෙකු ලෙස සඳහන් කරනු ලබන වයඹ පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ මෙහි 03 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ ය.

දෙපාර්තමේන්තුවේ සංයුතිය

(2) පළාත් අධ්‍යක්ෂවරයාට සහාය පිණිස දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගෙන් සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙක් ද දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතනයන්හි ප්‍රධානීන් ලෙස ආයතන අධිකාරිවරුන් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15ට එක් අයකු බැගින් වූ මූලස්ථාන සමාජ සේවා නිලධාරීන් තිදෙනෙක් ද හා ප්‍රමාණවත් සමාජ සේවා නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන් සහ සේවකයන්ගෙන් සමන් විත වන්නේ ය. (රජයේ ප්‍රතිපත්ති අනුව අනුමත කාර්ය මණ්ඩල වෙනස් විය හැකිය.)

(3) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පත් කිරීම, ස්ථාන මාරුකිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ වෙනත් අනුශාංගික කරුණු සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාල වන්නේ ය.

(4) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත් කරනු ලබන සියළුම නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයන් වශයෙන් සැලකිය යුතු ය.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන්

5. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා කර්තව්‍යයන් පහත සඳහන් පරිදි වේ.

(1) දිළිඳු පවුල් වල සාමාජිකයින් සඳහා මහජනාධාර මාසික දීමනාව ගෙවීම.

(2) දිළිඳු පවුල් වල ක්ෂය රෝග, පිළිකා, තැලසීමියා හා ලාදුරු රෝගීන් සඳහා සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකුගෙන් සැදුම්ලත් කමිටුවක නිර්දේශ මත ආධාර ගෙවීම.

(3) අනියම් වශයෙන් ආපදා වලට ලක්වී අනාථභාවයට පත් වූ පුද්ගලයින්ට සහ පවුල්වලට සහන සැලසීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම.

(4) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ප්‍රමිතියෙන් යුතු වැඩිහිටි නිවාස ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම.

(5) ආබාධ සහිත හා සෙමෙන් මනස වැඩෙන පුද්ගලයින් සඳහා ප්‍රමිතියෙන් යුතු නිවාස ආයතන පිහිටුවා පවත්වාගෙන යාම, පෙර පාසල් හා නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සහ සංවර්ධනය කිරීම.

(6) සහන අපේක්ෂා කරන දිළිඳු පවුල් වල ආබාධ සහිත පුද්ගලයින්ට ඇස් කණ්නාඩි, ශ්‍රවන උපකරණ, රෝද පුටු, ත්‍රෙසිකල්, අත්වාරු, කිහිලිකරු, ඇවිදින රාමු, අක්ෂි කාච, කෘතිම අත් පාද වැනි අපහසුතාවයන් මග හරවා ගැනීමට අවශ්‍ය වන්නාවූ උපකරණ සැපයීම.

(7) අසරණභාවයට පත් හා රැකවරණය අවශ්‍ය වැඩිහිටි පුද්ගලයින් සහ ආබාධ සහිත තැනැත්තන් නේවාසිකව තබාගෙන ඔවුන් රැකබලා ගැනීමට ස්වේච්ඡා සංවිධාන ලෙස ලියාපදිංචි ආයතන සඳහා නඩත්තු ආධාර, යථායෝග්‍යාධාර ලබාදීම, එවැනි සේවා සපයන ආයතන සඳහා සාමූහික ආධාර ලබාදීම හා එම ආයතන අධීක්ෂණය කිරීම.

(8) සමාජීය වශයෙන් අසරණභාවයට පත්ව සිටින, පත්වීමට ඉඩ ඇති පවුල් හෝ තැනැත්තන් සඳහා පුනරුත්ථාපන සේවා සැපයීම.

(9) සමාජයේ විවිධ හේතුන් නිසා මානසිකව පීඩාවට ලක් වූ හෝ ලක්වීමට ඉඩ ඇති තැනැත්තන් හෝ පවුල් සඳහා උපදේශන සේවා සැපයීම, එමගින් ඔවුන් පුනරුත්ථාපනය කිරීම හා ඒ සඳහා උපදේශන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම.

(10) ඉහත 02 වගන්තියේ අරමුණු වලට අදාළ විශේෂ අධ්‍යයන, සමීක්ෂණ හා පර්යේෂන පැවැත්වීම.

(11) අනියම් වශයෙන් ආපදාවට ලක්වී අනාථභාවයට පත් වූ තැනැත්තන්ට සහ පවුල් වලට සහන සැලසීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම හා විස්තීරණ වශයෙන් ආපාදාවට ලක්වී අනාථභාවයට පත් වූ තැනැත්තන්ට සහ පවුල් වලට අනෙකුත් සියළුම රාජ්‍ය ආයතනයන් මගින් සැලසෙන සේවා හා ආධාරයන්ගෙන් ආවරණය නොවන සහන සැලසීම හා පුනරුත්ථාපනය සැලසීම.

(12) වැඩිහිටි පුද්ගලයින්, ආබාධ සහිත පුද්ගලයින් නේවාසිකව තබාගන්නා හෝ එම අය වෙනුවෙන් සේවා සපයන හෝ වයඹ පළාත් තුළ පිහිටි සියළුම ආයතන ලියාපදිංචි කිරීම, එම ආයතනයන්හි සේවා සැපයීම පිළිබඳව ප්‍රමිතීන් සකස් කිරීම, එම ප්‍රමිතීන් ක්‍රියාත්මක වනතේ දැයි සොයා බැලීම, ලියාපදිංචි නොවන හෝ ප්‍රමිතීන් ක්‍රියාත්මක නොකරන හෝ ආයතන පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, ලියාපදිංචි ස්වේච්ඡා පදනමකින් ක්‍රියාත්මක වන නිවාස සඳහා නඩත්තු ආධාර ගෙවීම, යථායෝග්‍යාධාර ලබාදීම, එවැනි සේවා සපයන ආයතන සඳහා සාමූහික ආධාර ලබාදීම, ආයතන අධීක්ෂණය කිරීම හා විධිමත් කිරීම.

(13) සමාජ සේවා අධ්‍යක්ෂගේ අනුමැතියෙන් හෝ අධිකරණය මගින් හෝ ලියාපදිංචි ස්වේච්ඡා පදනමකින් ක්‍රියාත්මක වන නිවාසයන් වෙත ඇතුළත් කරනු ලබන වැඩිහිටි/ආබාධිත පුද්ගලයින් වෙනුවෙන් නඩත්තු ආධාර ලබාදීම.

(14) වැන්දඹු, විසුරුණු රෝගී ආබාධ සහිත අසරණ පවුල් වල දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම.

(15) නිවාස නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා පිළිසරණීය නිවාස ආධාර ලබාදීම.

(16) දීර්ඝ කාලීනව ප්‍රතිකාර ලබාගත යුතු බවට වෛද්‍යවරයෙකුගෙන් සැදුම් ලත් මණ්ඩලයකින් නිර්දේශ කරනු ලැබූ රෝගීන් සඳහා විශේෂ වෛද්‍යාධාර සැපයීම.

(17) බන්ධනාගාර ගත පුද්ගලයින්ගේ පවුල් පුනරුත්ථාපන වැඩ සටහන්

දෙපාර්තමේන්තු බලතල

6. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කාර්යයන් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු හෝ වාර්තා සමාජ සේවා අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරයෙකු විසින් යම් ආයතනයකින් හෝ පුද්ගලයකු වෙතින් ඉල්ලා සිටියහොත් ඔහු විසින් හෝ එම ආයතනය විසින් අධ්‍යක්ෂ වෙත එම තොරතුරු ලබාදිය යුතු වන්නේ ය.

(2) වයඹ පළාත තුළ පවත්වාගෙන යනු ලබන නිවාස හා සේවා සපයන ආයතන සියල්ල කවර ආයතනයක් යටතේ ලියාපදිංචි වී සිටිය ද එසේම ලියාපදිංචි වී නොසිටියද එම සියළු ආයතන වලට සමාජ සේවා අධ්‍යක්ෂ හෝ සමාජ සේවා අධ්‍යක්ෂ විසින් බලය පවරන යම් නිලධරයෙකුට කලින් දැනුම් දීමකින් තොරව ඕනෑම වේලාවක මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා

i. ඇතුල්වීමට
ii. යම් පරීක්ෂා කිරීමක්,
iii. විභාග කිරීමක්,
iv. විමර්ශනය කිරීමක්
v. සමීක්ෂණයක් පැවැත්වීමට
vi. එම කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හකි ලේඛන පරීක්ෂා කිරීම, තොරතුරු ලබා ගැනීම
vii. අවශ්‍ය ලිපිලේඛන ලබාගැනීම ඇතුළු යම් ක්‍රියාවක් කිරීමට බලය ඇත්තේ ය.

ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් හා කර්තව්‍යයන් සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන නිවාස/ආයතන ලියාපදිංචි විය යුතු බව

7. අංක 05 වගන්තිය යටතේ දැක්වෙන කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් වයඹ පළාත තුළ ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යනු ලබන නිවාස හා සේවා සපයනු ලබන ආයතන සියල්ල වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු වන්නේ ය.

1. විදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් මගින් පවත්වාගෙන යන නිවාසයක් හෝ ආයතනයක් නම්, රජයේ සමාජ සේවා අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ මහ ලේකම් කාර්යලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු වන්නේ ය.

2. උක්ත 05 වගන්තිය යටතේ දැක්වෙන කාර්යයන් හා කාර්ය භාරයන් ඉටු කිරීම සම්බන්ධයෙන් වයඹ පළාත තුළ කුමන පදනමකින් හෝ අළුතින් ආරම්භ කෙරෙන නිවාස සහ සේවා සපයනු ලබන ආයතන සියල්ල එසේ ආරම්භ කිරීමට පෙර වයඹ පළාතේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ තාවකාලික ලියාපදිංචිය ලබාගත යුතු වන්නේ ය.

3. එසේ ආරම්භ කරනු ලබන නිවාසය/ආයතනය එසේ අරඹා වර්ෂයක් සම්පූර්ණ වූ වහාම ස්ථිර ලියාපදිංචිය ලබාගත යුතු වන්නේ ය. (අවශ්‍යතාවය පදනම් කර ගනිමින් මාස 06කින් පසු තාවකාලික ලියාපදිංචිය ලබාදීම)

## II කොටස

### වයඹ පළාත් සමාජ සේවා අරමුදල

වයඹ පළාත් සමාජ සේවා අරමුදල

8. මෙම ප්‍රඥප්තියේ 02 වන වගන්තියේ සඳහන් අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා "වයඹ පළාත් සමාජ සේවා අරමුදල" නමින් ගිණුමක් ආරම්භ කොට පවත්වාගෙන යා යුතු වන්නේ ය.

අරමුදලේ සංයුතිය

9. (1) මෙම අරමුදල නමින් වෙනම බැංකු ගිණුමක් රාජ්‍ය බැංකුවට සමාජ සේවා අධ්‍යක්ෂ වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

(2) මෙම අරමුදල් ගිණුමට පහත සඳහන් මුදල් බැර කළ යුතු ය.

(i) රජයේ මුදල් ආධාර වශයෙන් වරින්වර ප්‍රදානය කරනු ලබන මුදල් ;

(ii) වයඹ පළාත් සභාව විසින් අරමුදල් ගිණුමේ කාර්ය සඳහා සම්මත කරනු ලබල මුදල් ;

(iii) පළාත් සභා පනතේ 22 වගන්තිය යටතේ රජය විසින් ලබාදෙන විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියලුම මුදල්

(iv) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රම වලින් ලබා ගන්නා සියලුම මුදල්

(v) දේශීය හෝ විදේශීය යම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් මගින් කෙරෙන පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල්

(3) මෙම ප්‍රඥප්තියේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා දරනු ලබන වියදම් මෙම අරමුදලින් ගෙවිය යුතු වන්නේ ය. අරමුදලේ වියදම් දැරීම

(4) එසේ වුවද, යම් නිශ්චිත කාර්යයන් සඳහා යෙදවිය යුතුය යන කොන්දේසි මත ඉහත 2 උප වගන්තියේ (iii)(iv) සහ (v) ඡේදයන් යටතේ මුදලක් ලැබුණු අවස්ථාවක එම මුදල් අරමුදලේ ගිණුමේ බැරට බාර ගැනීම අමාත්‍යවරයාගේ අභිමතය පරිදි විය යුතු වන්නේ ය. අරමුදල් ගිණුම පාලනය කිරීම

10. අමාත්‍යවරයාගේ අනුමැතිය මත පත් කරනු ලබන මණ්ඩලයක් යටතේ, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අරමුදල් ගිණුම පවත්වාගෙන යාමේ වගකීම අමාත්‍යාංශ ලේකම්වරයා සතු ය. අමාත්‍යවරයකු නොමැති අවස්ථාවකදී ලේකම්වරයාට අදාල බලතල ක්‍රියාත්මක කිරීමට බලය පැවරෙන්නේ ය.

11. අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු වන්නේ ය. අරමුදල් ගිණුමේ මුදල් වර්ෂය

12. රාජ්‍ය ආයතන වල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන හා වයඹ පළාත් සභාවේ මූල්‍ය රීති මෙම අරමුදල් ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාල විය යුතු වන්නේ ය. අරමුදල් ගිණුමේ මුදල් විගණනය

13. අමාත්‍යවරයා විසින් ලිත් වර්ෂය අවසන් වී මාස 06ක් ඇතුළත එකී ලිත් වර්ෂය සඳහා වූ අරමුදල් ගිණුමේ පරිපාලනය ගැන වූ වාර්තාවක් ද විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුමේ පිටපතක් ද එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ද සභාගත කළ යුතු වන්නේ ය. අරමුදල් ගිණුම පිළිබඳ වාර්තා

## III කොටස

### භාරකාර මණ්ඩලය

14. මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා පිහිටුවාගනු ලබන අරමුදල් ගිණුම පරිපාලනය කිරීම සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් සමාජ සේවා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කළ යුතු වන්නේ ය. භාරකාර මණ්ඩලය පත් කිරීම

(1) පළාත් සභාවේ සමාජ සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්, සභාපති

(2) පළාත් සභාවේ සමාජ සේවා අධ්‍යක්ෂ - ලේකම්

(3) පළාත් සභාවේ මූල්‍ය කළමනාකරණ පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්

(4) විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පිළිගත් ස්වේච්ඡා සංවිධාන වල නියෝජිතයන් දෙදෙනෙක්

15. මෙහි භාරකාර මණ්ඩලය සඳහා පත්කරනු ලබන සාමාජිකයකුගේ නිල කාලය පත් කළ දින සිට අවුරුදු 03ක් වන අතර, එම කාලය ඉකුත්වීම නිසා සාමාජිකත්වයෙන් ඉවත් වන තැනැත්තෙකු නැවත පත්වීම සඳහා සුදුස්සෙකු විය හැකි වන්නේ ය. මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම

16. නිල තත්වය මත පත් කරන ලද සාමාජිකයෙකු එම නිලය දැරීම අවසන් වනවාත් සමගම ඔහුගේ සාමාජිකත්වය අහෝසි වන අතර අනුප්‍රාප්තික තැනැත්තා ඉතිරි කාලය සඳහා පත් කළ යුත්තේ ය.

17. අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලිඛිත ඉල්ලීමක් මගින් නිල තත්වය මත පත් කරන ලද සාමාජිකයෙකුට සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමට අවකාශ ඇත.

18. සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ඇති වන පුරප්පාඩුවක් සඳහා නැවත පත් කරනු ලබන තැනැත්තෙකුගේ ධූර කාලය පූර්ව සාමාජිකයා පත් කරන ලද ධූර කාලයේ ඉතිරි කාලයට සීමා විය යුතු ය.

19. මණ්ඩලයේ යම් සාමාජිකයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයෙකු වුවහොත් හෝ එවැනි තනතුරකට පත්වුවහොත් එසේ පත්වන දින සිට ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වීමට නුසුදුස්සෙකු වන්නේ ය.

සන පූර්ණය

20. ඉහත අංක 16 යටතේ පත් කරන ලද මණ්ඩලයේ සනපූර්ණය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු වන්නේ ය.

21. උක්ත භාරකාර මණ්ඩලය අවම වශයෙන් මාස 03කට වරක් රැස්විය යුතු වන්නේ ය.

22. මෙම මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු යම් උසාවියකදී වැරදිකරුවෙකු වේ නම් හෝ යම් විෂමාචාර ක්‍රියාවක් හෙලිදරව් වීම හේතුවෙන් හෝ වැරදිකරුවකු වුවහොත් විෂයභාර අමාත්‍යවරයා විසින් ඔහුව/ඇයව සාමාජිකත්වයෙන් ඉවත් කළ යුතු ය.

## IV කොටස

### වරදවල් හා දණ්ඩන

23. යම් තැනැත්තෙකු,

වැරදි

(1) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් යටතේ හෝ සාදන ලද හෝ සපයනු ලබන හෝ යම් වාර්තාවක හෝ වෙනත් ලේඛනයක් මත දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශකයක් කරන්නාවූ ද,

(2) මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ ද,

(3) සමාජ සේවා අධක්ෂවරයාගේ නියෝග නිවේදන හෝ නියෝග සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින තැනැත්තන් ද,

(4) මෙම ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ නැතහොත් ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ එමගින් යම් තැනැත්තෙකු වෙත පැවරී ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලතල කාර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී ඒ තැනැත්තාට අවහිර හෝ බාධා කරන්නා වූ සෑම තැනැත්තෙකුම ද,

(5) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හා විධිවිධානයක් හෝ කඩකරන හෝ ඒ අනුව ක්‍රියාකිරීම උවමනාවෙන්ම පැහැර හරින සහ/හෝ උවමනාවෙන් අවහිර කරන අයෙකු ද,

ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

නඩු පැවරීමේ බලය

24. මෙම ප්‍රඥප්තිය යටතේ වරද සිදුකරනු ලැබූ විට නඩු පැවරීමේ බලය සමාජ සේවා අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකු සතු වන්නේ ය.

දඬුවම්

25. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකදී වරදකරු කිරීමෙන් අනතුරුව, රුපියල් දහදහසක් (රු. 10,000) අවමයකට හා රුපියල් ලක්ෂයකට (රු. 100,000) නොඉක්මවන දඩයකට හෝ මාස හයක් (6) නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයකට දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ යුතු වන්නේ ය.

මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුටම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලබන කල්හි රු. 5,000ක දඩයකට හෝ මාස 06කට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

## V කොටස

### පොදු විධිවිධාන

26. (1) ප්‍රඥප්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග පනවනු ලැබිය හැකිය. නියෝග සෑදීම

27. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු මාස 03ක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එකී නියෝගය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

28. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද ආයතන වල නඩත්තු උදෙසා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාල වන්නේ ය.

## VI කොටස

### අර්ථ නිරූපණය

29. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාත් සභාවේ සමාජ සේවා විෂය පැවරී ඇති අමාත්‍යවරයා ද, අර්ථ නිරූපණය

"අධ්‍යක්ෂ ' යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ වයඹ පළාතට පත් කර ඇති සමාජ සේවා අධ්‍යක්ෂවරයා ද,

"අනියම් ස්වභායේ ආපදා " යන්නෙන් පුළුල්ව පැතිරී නොගිය පුද්ගලයෙකුට පාලනය කර ගත නොහැකි හේතු නිසා සිදුවන ස්වභාවික සුළු හානි,

"ආබාධිත" යන්නෙන් මානසික ආබාධිත තත්වයක්, අපස්මාර තත්වයක් හෝ ජීවිතයේ අවශ්‍යතාවයන් මුළුමණින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින්ම තමා සඳහා ඉටුකර ගැනීමට නොහැකි වෙනත් ශාරීරික ආබාධ සහිත බව ද,

"දිළිඳු " යන්නෙන් ස්වකීය ජීවනෝපාය සඳහා එදිනෙදා ජීවිතයට මූලික වශයෙන් හා ආධාර දෙනු නොලැබුවහොත් ජීවිතය පවත්වාගෙන යාමට නොහැකි වූ පුද්ගලයෙක් ද,

"අරමුදල" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 08 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදල,

"මහජනාධාර" යනු ආදායම් මාර්ගයක් නොමැති දිළිඳු වයෝවෘද්ධ රෝගී ශාරිරික මානසික ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසිකව දෙනු ලබන ප්‍රදානය යන්න ද,

"ස්වේච්ඡා " යන්නෙන් පුරවැසි කණ්ඩායම් විසින් ස්වේච්ඡා පදනමක් මත පිහිටුවනු ලද වූ ද,

(1)

ආණ්ඩුවේ නොවන ස්වභාවයක් ඇත්තාවූ ද, ස්වකීය කර්තව්‍යන් කරගෙන යාමේදී මහජන සම්මාදම් මුදල්, දායක මුදල් ආණ්ඩුව විසින් ගෙවනු ලබන ආධාර මුදල් හා දේශීය විදේශීය පරිත්‍යාග මත යැපෙන්නන් ද,

(2)

මානසික හෝ ශාරීරික දුබලතාවකට පත්වූවන්, දිළින්දන් ද, අනාථයින් හා අසරණයින් සඳහා අවශ්‍ය වන සහනාධාර සහ බාහිර හා නේවාසික සේවාවන් සැපයීමෙන් ද, ස්වභාවික ව්‍යසන වලදී සහනාධාර සැපයීම ද ස්වකීය ප්‍රධාන අරමුණු ලෙස අත්තාවූ ද, යම් සංවිධානයක් අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

30. මේ ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

02-831

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.